අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - 2014 අගෝස්තු (නව නිර්දේශය)

# General Certificate of Education (Adv. Level) Examination – August 2014 (New Syllabus)

දේශපාලන විද්‍යාව I - පැය දෙකයි

## Political Science I – Two hours

**උපදෙස්:**

- **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- 01 සිට 50 තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි** පිළිතුර තෝරාගෙන එය **උත්තර පත්‍රයේ පසුපස දක්වෙන උපදෙස් පරිදි කතිරයක් (X) යොදා දක්වන්න.**
- එක් පිළිතුරකට ලකුණු 02 බැගින් මුළු ලකුණු 100 යි.

---

- 01 සිට 15 දක්වා ඇති ප්‍රශ්න සමන්විත වන්නේ ඒ ඒ ප්‍රශ්නයේ මාතෘකාව හා අදාළ ව සපයන ලද ප්‍රකාශ පහකිනි. එම ප්‍රකාශ අතුරෙන් නිවැරදි වන්නේ ප්‍රකාශ **හතරක්** පමණි. **නිවැරදි** ප්‍රකාශ ඇතුළත් කාණ්ඩය තෝරන්න.

01. දේශපාලන විද්‍යාව විෂයය අධ්‍යයනය කිරීමේ දී සැලකිලිමත් වන්නේ:

A - දේශපාලන සමාජ මුහුණ දෙන දේශපාලන ගැටලු පිළිබඳ ව
B - එම දේශපාලන ගැටලු කළමනාකරණය කිරීම සඳහා යොදාගත හැකි මෙවලම් පිළිබඳ ව
C - මිනිසුන් දේශපාලනය සමඟ සම්බන්ධ වීම කෙරෙහි බලපාන සාධක පිළිබඳ ව
D - ලෞකික ජීවිතයෙන් මිදීම සඳහා මිනිසුන්ට පිහිට වන වඩාත් ම සුදුසු රාජ්‍ය පාලන ක්‍රමය පිළිබඳ ව
E - ඉහත සඳහන් A, B හා C සම්බන්ධයෙන් අදාළ වන රාජ්‍ය පාලන ක්‍රමය පිළිබඳ ව

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

02. දේශපාලනය:

A - ආණ්ඩුවේ සහ රාජ්‍යයේ වැඩ කටයුතු හා සම්බන්ධ ක්‍රියාදාමය පිළිබඳ කලාවකි.
B - හොඳ හා නරක අතර වෙනස්කම් ඉගෙන ගැනීම හා බැඳුණු පොදු ක්‍රියාවකි.
C - එකඟතාව හා සාකච්ඡා කිරීම යන මාර්ග හරහා ගැටුම් විසඳා ගැනීමේ විශේෂිත වූ ක්‍රමවේදයකි.
D - පොදු සම්පත් ප්‍රයෝජනයට ගැනීම හා බෙදා හැරීම හා සම්බන්ධ ක්‍රියාදාමයකි.
E - මාර්ගය කුමක් වුව ද අපේක්ෂිත ඉලක්ක ඉටු කර ගැනීමේ බල අරගලයකි.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

03. චර්යාවාදය:

A - විසිවන සියවසේ මුල් කාලය තුළ දී නව මාක්ස්වාදීන් විසින් අධ්‍යයන ව්‍යාපාරයක් ලෙස ආරම්භ කෙරිණි.
B - පුද්ගලයින්ගේ සහ පුද්ගල කණ්ඩායම්වල දේශපාලන හැසිරීම නිරීක්ෂණය කිරීම හා විශ්ලේෂණය කිරීම හා සම්බන්ධ අධ්‍යයනයන් පිළිබඳ ව අවධානය යොමු කරයි.
C - විධිමත් හා නිරවද්‍ය විධික්‍රම අධ්‍යයන කාර්යයේ දී භාවිත කරනු ලැබේ.
D - මිනිසුන්ගේ දේශපාලන චර්යා රටාවන්ට අදාළ පැවතුම් ක්‍රම ගොඩනැගීමට උත්සාහ දරනු ලැබේ.
E - මිනිසුන්ගේ දේශපාලන චර්යා රටාවන් පිළිබඳ ව නියති ගොඩනැගීමට උත්සාහ දරනු ලැබේ.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

04. දේශපාලන විද්‍යාව අධ්‍යයනය කිරීම සඳහා වන සමාජ විද්‍යාත්මක ප්‍රවේශය මගින් අවධානය යොමු කරනු ලබන අධ්‍යයන කරුණු වන්නේ:

A - දේශපාලනය හා සමාජය අතර පවතින සම්බන්ධතාව ය.
B - දේශපාලන හා සමාජ සංවිධාන අතර පවතින සම්බන්ධතාව ය.
C - රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන අතර පවතින සම්බන්ධතාව ය.
D - බලය, අධිකාරී බලය හා සුජාතභාවය අතර පවතින සම්බන්ධතාව ය.
E - සමාජ චර්යාව හා දේශපාලන චර්යාව අතර පවතින සම්බන්ධතාව ය.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

05. ජාතික රාජ්‍ය ක්‍රමයේ ප්‍රධාන අංග ලක්ෂණ වන්නේ:

A - නීත්‍යානුකූල පදනම මත අධිකාරී බලය යොදවමින් නියෝග බලාත්මක කිරීමට ඇති හැකියාව
B - උත්තරීතර හා අසහාය බලයේ ඒකාධිකාරී හිමිකම
C - දෛනික වැඩකටයුතු කරගෙන යාම සඳහා භාවිතයට ගැනෙන පරිපාලන යාන්ත්‍රණය
D - පැවරී ඇති වැඩකටයුතු මුදාහැරලීම සඳහා ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රමය පමණක් භාවිතයට ගැනීම.
E - නීතිය, සාමය හා ආරක්ෂාව පවත්වාගෙන යාම සඳහා පොලීසිය හා සන්නද්ධ හමුදා පවත්වාගෙන යාම.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

EXAMMOOD.LK
EXAMMOOD.LK

06. ආණ්ඩුව:
A - ජාතික මට්ටමෙන් නීතිය හා පාලනය ක්‍රියාවට නැංවීම සඳහා යොදා ගැනෙන නිල ආයතනික යාන්ත්‍රණය
B - දේශපාලන හා පරිපාලන ආයතන පද්ධතියකින් යුත් දෙයක් වීම.
C - සාමූහික තීරණ ගැනීම හා ක්‍රියාවට නැංවීම හරහා සමාජය පාලනය කිරීමේ බලය භුක්ති විඳින ආයතනය වීම.
D - බලධාරී නීති ක්‍රියාවට නැංවීමේ අවශ්‍යතාව පැන නගින ඕනෑම අවස්ථාවක හා ඕනෑම ස්ථානයක පැවැත්ම සහිත දෙයක් වීම.
E - සමාජ යහපත වර්ධනය කිරීම උදෙසා අවශ්‍ය ම දෙයක් ලෙස අනධිකාරීවාදීන් විසින් ද පිළිගත් දෙයක් වීම.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

07. ධනවාදී ආර්ථික ක්‍රමයක ප්‍රධාන ලක්ෂණ වන්නේ:
A - වෙළෙඳපොළ ඉලක්ක කරගෙන භාණ්ඩ හා සේවාවන් නිපදවීම.
B - නිෂ්පාදන ප්‍රාග්ධනය මුළුමනින් ම පෞද්ගලික හස්තයන් දැරීම.
C - ඉල්ලුම හා සැපයුම යන පෞද්ගලික නොවන වෙළෙඳපොළ බලවේගවලට අනුකූල ව ආර්ථික ජීවිතය සංවිධානය වීම.
D - ආණ්ඩුව ආර්ථික ක්‍රියාවලියට මැදිහත් වීමෙන් පූර්ණ ලෙස වැළකී සිටීම.
E - ස්වයං භෞතික ආශාවන් හා ලාභ උපරිමනය ව්‍යවසායකත්වයේ සහ මහන්සි වී වැඩ කිරීමේ ගාමක බලවේග වීම.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

08. අවම රාජ්‍ය ක්‍රමයේ ප්‍රධාන ලක්ෂණ වන්නේ:
A - පුරවැසියන්ට තමන් හොඳයැ'යි සිතන ආකාරයේ පෞද්ගලික ජීවිතයක් ගත කිරීමට අවශ්‍ය සමාජ පරිසරය පවත්වාගෙන යාම.
B - පෞද්ගලික දේපළ ක්‍රමය හේතුවෙන් පැන නැගී ඇති සමාජ අසාධාරණත්වය තුරන් කිරීම සඳහා ක්‍රියා කිරීම.
C - ආර්ථික හා සමාජ කාර්යයන් මුළුමනින් ම පුද්ගලයින්ට හෝ පෞද්ගලික ව්‍යාපාරවලට අත්හැරීම.
D - රාත්‍රී මුරකරුවකුගේ තත්ත්වයට රාජ්‍යයේ භූමිකාව අවම කිරීම.
E - අභ්‍යන්තර අස්ථාවරභාවයෙන් හා බාහිර තර්ජනවලින් ජනතාව ආරක්ෂා කිරීම.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

09. සමාජවාදයේ මූලික ලක්ෂණ වන්නේ:
A - ධනවාදයට ප්‍රතිවිරුද්ධ දේශපාලන මතවාදයක් වීම.
B - ධනවාදයෙන් මතුකර ඇති මානව හා සමාජ ප්‍රශ්නවලට මානව දයාව වඩාත් පදනම් කරගත් විකල්ප සැපයීම.
C - තරගකාරීත්වය වෙනුවට සහයෝගීතාවට ප්‍රමුඛත්වය දීම.
D - පෞද්ගලිකවාදය වෙනුවට සාමූහිකවාදය අගය කිරීම.
E - සීමිත විවෘත වෙළෙඳපොළ ක්‍රමයක පැවැත්ම පිළිගැනීම.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

10. කාල් මාක්ස් දක්වූ ආකාරයට කොමියුනිස්ට් සමාජ ක්‍රමය:
A - විප්ලවකාරී නිර්ධන පංති ආඥාදායකත්වය යටතේ පවතින පරිවර්තනීය සමාජවාදී යුගයෙන් පසු ව බිහි වේ.
B - භාණ්ඩ නිෂ්පාදන කෙරෙන්නේ වෙළෙඳපොළ ඉලක්ක කරගෙන ය.
C - සමාජ ක්‍රමය ගොඩනැගී තිබෙන්නේ පොදු හිමිකම මත ය.
D - පංති විරහිත සමාජ ක්‍රමයක් වේ.
E - රාජ්‍ය විරහිත සමාජයක් වේ.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

11. ස්වාධිපත්‍ය:
A - අසහාය සහ අසීමිත බලය පිළිබඳ න්‍යාය හැඳින්වෙන පදය වේ.
B - රාජ්‍යයට බලාධිකාරී බලයේ ඒකාධිකාරය සපයනු ලැබේ.
C - රාජ්‍යය ක්‍රියාවට නංවන්නේ අධිකරණය හා විධායකය හරහා ය.
D - රාජ්‍යය අනෙක් සෑම දේශපාලන හා සමාජ සංවිධානවලට වඩා ඉහළින් තබනු ලැබේ.
E - අභ්‍යන්තර හා බාහිර වශයෙන් පැතිකඩ දෙකකි.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

EXAMMOOD.LK
EXAMMOOD.LK

12. බලතල බෙදීම:

A - ආණ්ඩුවේ ප්‍රධාන කාර්යයන් තුන එකිනෙකින් වෙන් කළ යුතු බවට අවධාරණය කරන න්‍යාය වේ.
B - ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණය හා ජනතාවගේ නිදහස ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් අතිශය වැදගත් මූලධර්මයක් ලෙස පිළිගනු ලැබේ.
C - "එක් අයෙකු අත බලය ඒකරාශී වීම ආඥාදායකත්වයක් ඇති වීමට මග පාදනු ලැබේ." යන උපකල්පනය මත ගොඩනගා ඇත.
D - සන්ධීය ආණ්ඩුක්‍රම තුළ මධ්‍යම ආණ්ඩුව හා සන්ධීය කොටස් අතර බලය බෙදීම සඳහා භාවිතයට ගැනෙන න්‍යාය වේ.
E - 1789 ඇමෙරිකානු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්පාදනයේ දී යොදාගත් මූලික න්‍යායක් වේ.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

13. මිනිසුන් නීතියට යටත් වන්නේ:

A - එහි සුජාතභාවය හේතුකොට ගෙන ය.
B - යටත් නොවීමෙන් මුහුණ දීමට සිදුවන ප්‍රතිඵල පිළිගැනීමට අකමැති නිසා ය.
C - යහපත් සමාජයක පැවැත්ම සඳහා නීති අවශ්‍ය වනවා ය යන විශ්වාසය නිසා ය.
D - නීති සියලු දෙනාට ම එක හා සමාන වනවා ය යන පොදු පිළිගැනීම නිසා ය.
E - බලයේ සිටින ආණ්ඩුවට සහය දක්වීමට ඇති කැමැත්ත නිසා ය.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

14. පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයේ ඉතා ම වැදගත් මූලධර්ම වන්නේ:

A - මැතිවරණවල දී තීරණය කරන ලද පාර්ලිමේන්තුව නියෝජනය කරන දේශපාලන පක්ෂවල ශක්තිය මත ආණ්ඩුව පිහිටුවීම.
B - ආණ්ඩුව පාර්ලිමේන්තුවේ විශ්වාසය මත රඳා පවතින බැවින් පාර්ලිමේන්තුවට වගකීමට ආණ්ඩුව බැඳී සිටීම.
C - විධායකයේ සාමාජිකයින් සාමාන්‍යයෙන් පාර්ලිමේන්තුවේ බහුතර ආසන සංඛ්‍යාවක් හිමි පක්ෂයේ සාමාජිකයින් අතුරෙන් පත් කිරීම.
D - විධායකය සාමූහික එකක් වීම.
E - ආණ්ඩුවේ නායකයා වන අගමැති රාජ්‍ය නායක ධූරය හා ප්‍රධාන අණදෙන නිලධාරී තනතුරු දැරීම.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

15. ජනාධිපති ආණ්ඩුක්‍රමයේ ප්‍රධාන මූලධර්ම:

A - විධායකය හා ව්‍යවස්ථාදායකය එකිනෙකට වෙනස් මැතිවරණ දෙකකින් තෝරා ගැනීම.
B - ව්‍යවස්ථාව මගින් එකිනෙකින් ස්වාධීන වූ බල ක්ෂේත්‍ර දෙකක් විධායකයට හා ව්‍යවස්ථාදායකයට පවරා තිබීම.
C - විධායක බලය ජනාධිපතිවරයා අත ඒකරාශි කිරීම.
D - රාජ්‍ය නායක හා ආණ්ඩුවේ නායක යන තනතුරු දෙක ජනාධිපති නිලය වටා කේන්ද්‍රගත කර තිබීම.
E - විශ්වාසභංග යෝජනාවක් සම්මත කිරීම මගින් ජනාධිපතිවරයා ධූරයෙන් ඉවත් කිරීමට ව්‍යවස්ථාදායකයට හැකි වීම.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

✪ **16 සිට 21 දක්වා** ප්‍රශ්න සඳහා ඒ ඒ ප්‍රශ්නයේ මාතෘකාවට අදාළ ව ප්‍රකාශ පහක් දක්වා ඇත. ඒවායින් එක් ප්‍රකාශයක් සාවද්‍ය වේ. **සාවද්‍ය** ප්‍රකාශය තෝරන්න.

16. සමූහ ආඥාදායක (Totalitarian) ආණ්ඩුක්‍රමයක ප්‍රධාන ලක්ෂණ වන්නේ:

(1) නිල මතවාදයක් තිබීම.
(2) රාජ්‍යයේ පාලනයෙන් පූර්ණ ලෙස නිදහස් වූ ආර්ථික ජීවිතය
(3) එක පක්ෂයක් පමණක් පැවතීම.
(4) ජනමාධ්‍යය සම්බන්ධයෙන් රාජ්‍යයේ ඒකාධිකාරය
(5) මර්ධනකාරී පාලන යාන්ත්‍රණයක් පවත්වාගෙන යාම.

17. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව:

(1) රටක දේශපාලන ක්‍රමයේ ක්‍රියාකාරිත්වයට අදාළ නීති පද්ධතිය අඩංගු ලියවිල්ල වේ.
(2) දේශපාලන ක්‍රමයක ජීවත්වන පුරවැසියන්ගේ සමාජ හැසිරීම හා සම්බන්ධ නීති හා රෙගුලාසි දක්වෙන ලියවිල්ල වේ.
(3) ප්‍රජාතන්ත්‍රවාදී සහ නීත්‍යානුකූල පාලනය සඳහා ඉතා ම වැදගත් අවශ්‍යතාවයක් ලෙස සැලකේ.
(4) ලිඛිත-අලිඛිත, සන්ධීය-ඒකීය සහ නම්‍ය-අනම්‍ය ලෙස වර්ග කරනු ලැබේ.
(5) මිනිස් අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ ඉතා ම හොඳ මාර්ගය ලෙස සලකනු ලැබේ.

EXAMMOOD.LK

18. දේශපාලන සංස්කෘතිය:
(1) දේශපාලන විශ්ලේෂණය සඳහා නූතනයේ භාවිතයට ගැනෙන වැදගත් මෙවලමක් වේ.
(2) දෙවන ලෝක යුද්ධයෙන් පසුකාලය තුළ දී ඇමෙරිකානු දේශපාලන විද්‍යාඥයින් විසින් ප්‍රචලිත කරන ලදී.
(3) දේශපාලන ක්‍රමය කෙරෙහි ජනතාව ප්‍රකාශ කරන විශ්වාස, ආකල්ප හා අගය කිරීම්වලින් සමන්විත වේ.
(4) ලෝකයේ අද සිදුවෙමින් පවතින දේශපාලන සංසිද්ධීන් පිළිබිඹු කරයි.
(5) විවිධ දේශපාලන ක්‍රම සංසන්දනය කිරීම සඳහා යොදාගත හැකි සංකල්පයක් වේ.

19. දේශපාලන පක්ෂ:
(1) බලය දිනා ගැනීම හරහා ආණ්ඩු බලය ක්‍රියාවට නැංවීමේ අරමුණෙන් සංවිධානය වූ සංවිධාන වේ.
(2) නිල දේශපාලන, ආර්ථික හා සමාජ මතවාදයක් සහිත ව සංවිධානය වූ සංවිධාන වේ.
(3) රාජ්‍යය සහ සිවිල් සමාජය එකට යා කරන්නා වූ වැදගත් පුරුකක් වේ.
(4) සමාජය තුළ සමාජ හා ආගමික මතභේද ඇති කරන්නා වූ එක් මූලාශ්‍රයක් වේ.
(5) ප්‍රජාතන්ත්‍රවාදය සමග ඉතා ම කිට්ටුවෙන් සම්බන්ධ වන අතර, එම දෙක එකිනෙකින් වෙන්කළ හැකි නොවේ.

20. පළාත් පාලන ආණ්ඩුක්‍රම:
(1) නිශ්චිත ප්‍රාදේශීය බල ප්‍රදේශයක් තුළ ක්‍රියාත්මක වන විශේෂිත ආණ්ඩුක්‍රමයක් වේ.
(2) ස්වාධිපති බලයේ හිමිකමක් නොමැති ආණ්ඩුක්‍රමයක් වේ.
(3) ස්වපැවැත්ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පූර්ණ ලෙස සහතික කරන ලද ආණ්ඩුක්‍රමයක් වේ.
(4) මධ්‍යම බල අධිකාරියෙන් අවධාරිත බලතල හා කාර්යයන් භුක්ති විඳින ආණ්ඩුක්‍රමයක් වේ.
(5) මධ්‍යම බල අධිකාරියට මුළුමනින් ම යටත් වූ ආණ්ඩුක්‍රමයක් වේ.

21. නිර්දිෂ්ට රටවල ආණ්ඩුක්‍රමයන්හි සමහර විශේෂිත ලක්ෂණ:
(1) අලිඛිත ව්‍යවස්ථාවක් මත ගොඩනැගී තිබෙන බ්‍රිතාන්‍ය ආණ්ඩුක්‍රමය තුළ සිරිත් විරිත් හා සම්ප්‍රදායන් අතිශය ප්‍රමුඛ භූමිකාවක් රඟ දක්වනු ලැබේ.
(2) බලතල බෙදීම, සංවරණය හා තුලනය කිරීම ඇමෙරිකානු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ පදනම් මූලධර්ම වන අතර, ඒවා භාවිතයට ගෙන ඇත්තේ ආණ්ඩුක්‍රමය තුළ විධායක ආඥාදායකත්වයක් ඇති වීම වැළැක්වීම සඳහා ය.
(3) ස්විට්සර්ලන්තය තුළ පවතින සන්ධීය ආණ්ඩුක්‍රමයේ මධ්‍යම ආණ්ඩුවේ විධායකය 'සාමූහික විධායකය' නමින් හඳුන්වන අතර, එහි සාමාජිකයන් පත් කරන්නේ සන්ධීය ව්‍යවස්ථාදායකය මගිනි.
(4) 1958 දී ප්‍රංශය තුළ ස්ථාපිත කළ පස්වන සමූහාණ්ඩුක්‍රමය දෙමුහුන් විධායකයක් වන අතර, එහි විධායක බලතල බල හවුල්කාරීත්වය යටතේ ජනාධිපති හා අගමැති විසින් ක්‍රියාවට නංවනු ලැබේ.
(5) ඉන්දියානු ආණ්ඩුක්‍රමය අර්ධ සන්ධීය ආණ්ඩුක්‍රමයක් වන අතර, එය සමන්විත වන්නේ තමන් කැමති ඕනෑම අවස්ථාවක සන්ධීය ක්‍රමයෙන් ඉවත් ව යාමට අවසරය ඇති ප්‍රාන්ත රාජ්‍ය විසි අටකිනි.

✪ 22 සිට 30 දක්වා ඇති ප්‍රශ්න සඳහා ඒ ඒ ප්‍රශ්නයේ මාතෘකාව හා සම්බන්ධ ව ප්‍රකාශ පහක් දක්වා ඇත. එම ප්‍රකාශ අතුරෙන් **හතරක්** සාවද්‍ය වේ. **සාවද්‍ය** ප්‍රකාශ කාණ්ඩය තෝරන්න.

22. නිර්දිෂ්ට රටවල්වල ව්‍යවස්ථාදායක සභාවන්හි සමහර විශේෂිත ලක්ෂණ වන්නේ:
(A) බ්‍රිතාන්‍ය ආණ්ඩුක්‍රමය තුළ පාර්ලිමේන්තුව නමින් හඳුන්වන ව්‍යවස්ථාදායකය සමන්විත වන්නේ ව්‍යවස්ථාදායකය පිළිබඳ සමාන බලතල භුක්ති විඳින මණ්ඩල දෙකකිනි.
(B) කොන්ග්‍රස් මණ්ඩලය නමින් හඳුන්වන ඇමෙරිකානු ව්‍යවස්ථාදායකය ද්වි මාණ්ඩලික වන අතර, එහි දෙවන මණ්ඩලය වූ සෙනෙට් සභාව පළමු මණ්ඩලය වූ මහජන මන්ත්‍රී මණ්ඩලයට වඩා බලවත් වේ.
(C) ෆෙඩරල් සභාව නමින් හඳුන්වන ස්විට්සර්ලන්තයේ ව්‍යවස්ථාදායකය ද්වි මාණ්ඩලික වන අතර, එම මණ්ඩල දෙකේ සාමාජිකයින් පස් වසරක නිල කාලයක් සඳහා මහජනතාව හා කැන්ටන් විසින් තෝරා පත්කරනු ලැබේ.
(D) වර්තමාන ප්‍රංශ ආණ්ඩුක්‍රමයේ පාර්ලිමේන්තුව නමින් හඳුන්වන ව්‍යවස්ථාදායකය ද්වි මාණ්ඩලික වන අතර, එම මණ්ඩල දෙක ඕනෑම අවස්ථාවක තනි අභිමතය අනුව විසුරුවා හැරීමට ජනාධිපතිවරයාට හැකියාව ඇත.
(E) ඉන්දියාවේ මධ්‍යම ආණ්ඩුවේ ව්‍යවස්ථාදායකය ද්වි මාණ්ඩලික වන අතර, එහි දෙවන මණ්ඩලය වූ රාජ්‍ය සභාව බලතල හා කාර්යයන් අතින් මහා බ්‍රිතාන්‍යයේ සාමි මන්ත්‍රී මණ්ඩලයට බෙහෙවින් ම සමාන වේ.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

23. 'අන්තර්ජාතික දේශපාලනය' යන්නෙන් අදහස් කරන්නේ:
(A) නිදහස් ස්වාධිපති ජාතික රාජ්‍යයන් අතර කෙරෙන්නා වූ දේශපාලනය
(B) අන්තර්ජාතික සමාජය තුළ පුද්ගල කණ්ඩායම් අතර කෙරෙන්නා වූ දේශපාලනය
(C) අන්තර්ජාතික රාජ්‍ය සංවිධාන අතර කෙරෙන්නා වූ දේශපාලනය
(D) අන්තර්ජාතික රාජ්‍ය නොවන සංවිධාන අතර කෙරෙන්නා වූ දේශපාලනය
(E) බහුජාතික සමාගම් අතර කෙරෙන්නා වූ දේශපාලනය

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

24. රාජ්‍ය ප්‍රතිපත්ති යනුවෙන් අදහස් කරන්නේ:
(A) පුද්ගලයකු විසින් ක්‍රියාවට නංවන ක්‍රියාකාරී සැලැස්මක් ය.
(B) පුද්ගල කණ්ඩායමක් විසින් ක්‍රියාවට නංවන ක්‍රියාකාරී සැලැස්මක් ය.
(C) ව්‍යාපාරික සමාගමක් විසින් ක්‍රියාවට නංවන ක්‍රියාකාරී සැලැස්මක් ය.
(D) කුටුම්බයක් විසින් ක්‍රියාවට නංවන ක්‍රියාකාරී සැලැස්මක් ය.
(E) ආණ්ඩුව විසින් ක්‍රියාවට නංවන ක්‍රියාකාරී සැලැස්මක් ය.
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

25. සමාජ ගැටුමක් යනු:
(A) පුද්ගලයා තුළ ඇතිවන ගැටුමක් ය.
(B) පුද්ගලයන් දෙදෙනෙකු අතර ඇතිවන ගැටුමක් ය.
(C) සංවිධාන දෙකක් අතර ඇතිවන ගැටුමක් ය.
(D) සමාජ කණ්ඩායම් දෙකක් අතර ඇතිවන ගැටුමක් ය.
(E) රටවල් දෙකක් අතර ඇතිවන ගැටුමක් ය.
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

26. රාජකාරී ක්‍රමය අහෝසි කළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණය වූයේ:
(A) කෝල්බෲක්-කැමරන් (B) මැනිං (C) මැනිං-ඩෙවන්ෂයර්
(D) ඩොනමෝර් (E) සෝල්බරි
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

27. ලංකාවේ ව්‍යවස්ථාදායක සභාවට නියෝජිතයින් තෝරාපත් කරගැනීමට ප්‍රථමවරට ඡන්ද බලය හඳුන්වා දුන් ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණය වූයේ:
(A) 1833 කෝල්බෲක්-කැමරන් ප්‍රතිසංස්කරණ
(B) 1911 කෲව්-මැකලම් ප්‍රතිසංස්කරණ
(C) 1924 මැනිං-ඩෙවන්ෂයර් ප්‍රතිසංස්කරණ
(D) 1931 ඩොනමෝර් ප්‍රතිසංස්කරණ
(E) 1948 සෝල්බරි ප්‍රතිසංස්කරණ
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

28. 1924 මැනිං-ඩෙවන්ෂයර් ආණ්ඩුක්‍රමය අසාර්ථක වීම කෙරෙහි බලපෑ ප්‍රධාන සාධකය වූයේ:
(A) වාර්ගික නියෝජනය
(B) ව්‍යවස්ථාදායකයේ මුළු සාමාජික සංඛ්‍යාව ඉහළ දැමීම.
(C) නිල නොලත් සාමාජිකයින් ඡන්දයෙන් තෝරා ගැනීමේ ක්‍රමය හඳුන්වා දීම.
(D) වගකීමෙන් බලය වෙන් කිරීම.
(E) මුදල් කාරක සභාවේ තත්ත්වය ශක්තිමත් කිරීම.
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

29. ලංකාවේ ජාතික ව්‍යාපාරය:
(A) බ්‍රිතාන්‍ය යටත් විජිත පාලනයෙන් පූර්ණ නිදහස ලබා ගැනීම සඳහා ඉතා ම දැඩි ලෙස උද්ඝෝෂණ ව්‍යාපාරයන්හි නියුක්ත විය.
(B) ජාතික අනුකලනය ගොඩනැගීම සඳහා දැඩි ලෙස උනන්දු විය.
(C) බටහිරකරණය වූ සමාජීය ප්‍රභූන් ආරම්භ කොට නායකත්වය දුන් සාමකාමී ව්‍යාපාරයක් විය.
(D) සමාජයේ සෑම සමාජීය හා වාර්ගික කණ්ඩායම් සහභාගි වූ ජනතා ව්‍යාපාරයක් විය.
(E) ඉන්දියානු ජාතික ව්‍යාපාරයට බෙහෙවින් ම සමාන විය.
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

30. ශ්‍රී ලංකාවේ වාමාංශික ව්‍යාපාරය:
(A) වතු ව්‍යාපාරයෙන් උපත ලද නව ලාංකික ධනපති පංතිය විසින් ආරම්භ කළේ ය.
(B) යුතෝපීය සමාජවාදීන්ගේ අදහස්වලින් දැඩි ව බලපෑම් ලද ව්‍යාපාරයක් විය.
(C) ලංකාව තුළ සමාජ ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුවක් පිහිටුවීම ඉලක්කය විය.
(D) බටහිර අධ්‍යාපනය ලද, මාක්ස්වාදයට නැඹුරු වූ තරුණ රැඩිකල් කණ්ඩායමක් විසින් ආරම්භ කළේ ය.
(E) නිදහස දිනා ගැනීම උදෙසා ලංකා ජාතික සංගමය සමඟ සමීප සහයෝගීතාවකින් ක්‍රියා කළේ ය.
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

EXAMMOOD.LK
EXAMMOOD.LK

- 31 සිට 41 දක්වා ප්‍රශ්න සඳහා ඒ ඒ මාතෘකාව හා සම්බන්ධ ව ප්‍රකාශ පහක් ඉදිරිපත් කොට ඇත. ඒවායින් නිවැරදි වන්නේ ප්‍රකාශ **හතරක්** පමණි. **නිවැරදි** ප්‍රකාශ අන්තර්ගත කාණ්ඩය තෝරන්න.

31. වගකීම් සහිත ආණ්ඩුක්‍රමයක් ලංකාවට ලබාදීම නිර්දේශ නොකිරීම සඳහා ඩොනමෝර් කොමිසම කෙරෙහි බලපෑ හේතු සාධක වූයේ:
(A) දේශීය දේශපාලනඥයින් දේශපාලන වශයෙන් මුහුකුරා නොතිබීම.
(B) ජනතාව තුළ සාමූහික හැඟීමක් හා එක්සත්භාවයක් නොතිබීම.
(C) සාමාන්‍ය ජනතාවගේ දේශපාලන සහභාගීත්වය පහළ මට්ටමක පැවතීම.
(D) වගකීම් සහිත ආණ්ඩුක්‍රමයකට එරෙහි ව බර්ගර් ජන කොටස දැක්වූ දැඩි විරුද්ධත්වය
(E) සංවිධානාත්මක දේශපාලන පක්ෂ ක්‍රමයක් නොතිබීම.
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

32. ඩොනමෝර් ආණ්ඩුක්‍රමය යටතේ ආණ්ඩුකාරයා:
(A) බ්‍රිතාන්‍ය කිරීටයේ සහ බ්‍රිතාන්‍ය ආණ්ඩුවේ නියෝජිතයා විය.
(B) ආමාත්‍ය මණ්ඩලයේ නායකයා විය.
(C) ආණ්ඩුක්‍රමයේ ප්‍රධාන විධායකයා විය.
(D) යටත් විජිතය තුළ අධිරාජ්‍යයේ ආශාවන් ආරක්ෂා කිරීමේ ප්‍රධානියා විය.
(E) සෑම පනතකට ම අවසාන අනුමැතිය දීමේ බල අධිකාරිය ඉසිලීය.
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

33. 1948 සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රධාන ලක්ෂණ:
(A) අග්‍රාණ්ඩුකාරවරයා සහ කැබිනට් අමාත්‍යවරුන්ගෙන් සමන්විත විධායක ආණ්ඩුව
(B) අග්‍රාණ්ඩුකාරවරයා ද, සෙනෙට් මණ්ඩලය සහ මහජන මන්ත්‍රී මණ්ඩලය යන නම්වලින් හැඳින්වුණු ද්විත්ව මණ්ඩලයෙන් ද සමන්විත ව්‍යවස්ථාදායකය
(C) අග්‍රාණ්ඩුකාරවරයා ව්‍යවස්ථාදායකයට වගකිව යුතු වීම.
(D) ස්වාධීන රාජ්‍ය සේවාවක් පවත්වාගෙන යාම සහතික කිරීම උදෙසා ස්ථාපිත කළ රාජ්‍ය සේවා කොමිසම
(E) ශ්‍රේෂ්ඨාධිකරණයේ නායකත්වයෙන් යුත් ස්වාධීන අධිකරණය
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

34. 1948 සෝල්බරි ව්‍යවස්ථාව යටතේ දේශපාලන විධායකය:
(A) කැබිනට් අමාත්‍ය මණ්ඩලය ලෙස හැඳින්විණ.
(B) අග්‍රාණ්ඩුකාරවරයා විසින් මහජන මන්ත්‍රී මණ්ඩලයේ සාමාජිකයින් අතුරෙන් පත් කෙරිණ.
(C) අගමැති නමින් හැඳින්වුණ ඇමතිවරයකුගේ නායකත්වය යටතේ පැවතියේ ය.
(D) පාර්ලිමේන්තුවට සාමූහික ව වගකිව යුතු විය.
(E) ව්‍යවස්ථාදායකය විසින් සම්මත කරන විශ්වාසභංග යෝජනාවක් මගින් ඉවත් කළ හැකි විය.
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

35. සුළුතර ජන කොටස්වල අයිතිවාසිකම් ආරක්ෂා කිරීම උදෙසා සෝල්බරි ව්‍යවස්ථාවෙන් සැපයූ විශේෂ ආවරණ:
(A) මූලික අයිතිවාසිකම් පිළිබඳ විශේෂ පරිච්ඡේදය
(B) ව්‍යවස්ථාවේ 29(2) වගන්තිය
(C) සෙනෙට් සභාව
(D) බහු මන්ත්‍රී ඡන්ද කොට්ඨාස සහ අග්‍රාණ්ඩුකාරවරයා විසින් නාමකරණයෙන් සය දෙනෙකු නියෝජිත මන්ත්‍රී මණ්ඩලයට පත් කිරීම.
(E) ස්වාධීන අධිකරණය සහ ස්වාධීන රාජ්‍ය සේවාව
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

36. 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රධාන අංග ලක්ෂණ:
(A) වෙස්ට්මින්ස්ටර් ආකෘතියෙන් පූර්ණ ලෙස බිඳී යාම සනිටුහන් කළේ ය.
(B) ශ්‍රී ලංකාව දේශපාලන වශයෙන් ස්වාධීන ස්වෛරී ජනරජයක් බවට පත් කළේ ය.
(C) පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය හරහා ශ්‍රී ලංකාව සමාජ ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයක් බවට පරිවර්තනය කිරීම ඉලක්කකර ගත්තේ ය.
(D) අධිකරණයේ සහ රාජ්‍ය සේවයේ ස්වාධීනත්වය අවප්‍රමාණ කළේ ය.
(E) ශ්‍රී ලංකා රාජ්‍යයේ අනාගමික ස්වරූපය වෙනස් කළේ ය.
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

EXAMMOOD.LK

37. 1972 ව්‍යවස්ථාව යටතේ ස්ථාපිත කළ ව්‍යවස්ථාදායකයෘ
(A) ඒක මණ්ඩල වූ අතර ජාතික රාජ්‍ය සභාව නමින් හැඳින්විනි.
(B) ජනතාවගේ ව්‍යවස්ථාදායක, විධායක හා අධිකරණ බලය ක්‍රියාවට නැංවීය.
(C) ජනතා පරමාධිපත්‍ය ක්‍රියාවට නැංවීම සම්බන්ධයෙන් නීතිමය සීමාවන් නොවී ය.
(D) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කිරීමට හෝ පරිච්ඡින්න කිරීමට හැකි උත්තරීතර ව්‍යවස්ථාදායක බලය භුක්ති වින්දේ ය.
(E) ජනතාව විසින් තෝරා පත්කළ නියෝජිතයින් 225 කින් සමන්විත විය.
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

38. 1978 දෙවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෘ
(A) ශ්‍රී ලංකාවේ 'ගෝලිස්ට් ව්‍යවස්ථාව' ලෙස හඳුන්වනු ලැබේ.
(B) විධායකයේ ස්වාධීනත්වය ඉතා ම දැඩි ලෙස අවධාරණය කර ඇත.
(C) විවේචකයින්ට අනුව ව්‍යවස්ථානුකූල ඒකතන්ත්‍ර පාලන ක්‍රමයක් ගොඩනැගීමට දායක වී ඇත.
(D) අගමැති තනතුර ඉතා ම දැඩි ලෙස අවප්‍රමාණය කර ඇත.
(E) රට තුළ යහපාලනය ශක්තිමත් කිරීමට විශාල වශයෙන් දායක වී ඇත.
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

39. 1978 ව්‍යවස්ථාව යටතේ ජනාධිපතිවරයාෘ
(A) සය අවුරුදු නිල කාලයක් සඳහා ජනතාව විසින් සෘජුව ම තෝරා පත් කෙරේ.
(B) ජනතාවගේ විධායක බලය ක්‍රියාවට නැංවීමේ උත්තරීතර උපකරණය වේ.
(C) විධායක බලතල ක්‍රියාවට නැංවීම සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවට වගකීමට බැඳී නැත.
(D) 18 වන ව්‍යවස්ථා සංශෝධනයට අනුව ඕනෑම වාර ගණනක් නිලයට තේරී පත් විය හැක.
(E) පාර්ලිමේන්තුව විසින් සම්මත කරන දෝෂාභියෝගයකින් නිලයෙන් ඉවත් කිරීමට යටතේ වේ.
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

40. 1978 ව්‍යවස්ථාව යටතේ ව්‍යවස්ථාදායකයෘ
(A) ඒක මණ්ඩලික වන අතර, පාර්ලිමේන්තුව නමින් හැඳින්වේ.
(B) ජනතාවගේ ව්‍යවස්ථාදායක බලය ක්‍රියාවට නංවන උත්තරීතර උපකරණය වේ.
(C) රාජ්‍ය අරමුදල්වල උත්තරීතර භාරකරුවා වේ.
(D) යම් යම් ව්‍යවස්ථානුකූල සීමාවන්ට යටත් ව ජනාධිපතිවරයා විසින් විසුරුවා හැරීමට යටත් වේ.
(E) ජනතා ඡන්දයෙන් තේරීපත්වන නියෝජිතයින් 196 කින් සහ ජාතික ලැයිස්තුවෙන් පත් කෙරෙන මන්ත්‍රීවරුන් 29 කින් සමන්විත වේ.
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

41. 1978 ව්‍යවස්ථාවේ 105 වන වගන්තියට අනුව ශ්‍රී ලංකාවේ අධිකරණ පද්ධතිය සමන්විත වන්නේෘ
(A) ශ්‍රේෂ්ඨාධිකරණය (B) අභියාචනාධිකරණය
(C) මහාධිකරණය (D) කාති විනිශ්චය සභා
(E) පාර්ලිමේන්තුව විසින් කලින් කල නියම කොට පිහිටුවන වෙනත් මුල් අවස්ථා අධිකරණ
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

✪ **42 සිට 46** දක්වා ඇති ප්‍රශ්නවල ඒ ඒ ප්‍රශ්නයේ මාතෘකාවට අදාළ ව ප්‍රකාශ පහක් දක්වා ඇත. එම ප්‍රකාශ අතුරෙන් එකක් නිවැරදි වේ. **නිවැරදි** ප්‍රකාශය තෝරන්න.

42. 1978 ව්‍යවස්ථාවට අනුව අගමැති තනතුරට පත් කළ යුත්තේෘ
(1) පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂයේ වඩාත් ම ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරයා ය.
(2) පාර්ලිමේන්තුවේ වැඩි ම ආසන සංඛ්‍යාවක් හිමිකරගෙන තිබෙන පක්ෂයේ නායකයා ය.
(3) පාර්ලිමේන්තුවේ බහුතර විශ්වාසය දිනාගත හැකි යැයි ජනාධිපතිවරයා කල්පනා කරන මන්ත්‍රීවරයා ය.
(4) පාර්ලිමේන්තුවේ බහුතර බලය හිමි පක්ෂය විසින් නම් කරන මන්ත්‍රීවරයා ය.
(5) පාර්ලිමේන්තුව නියෝජනය කරන සියලු ම පක්ෂ ඒකමතික ව නිර්දේශ කරන මන්ත්‍රීවරයා ය.

43. 1978 ව්‍යවස්ථාවට අනුව ජනාධිපති තනතුර හිස් වී අනුප්‍රාප්තිකයකු පත් කරන තුරු ජනාධිපති තනතුරේ වැඩ බැලීම සඳහා පත් කළ යුත්තේෘ
(1) අගමැති ය. (2) කථානායක ය. (3) අගවිනිසුරු ය. (4) සභානායක ය.
(5) ජනාධිපති තනතුරට පත් කිරීමට සුදුසුකම් ඇති පාර්ලිමේන්තුව විසින් පත් කරන මන්ත්‍රීවරයකු ය.

EXAMMOOD.LK
EXAMMOOD.LK

44. 1978 ව්‍යවස්ථාවට අනුව පාර්ලිමේන්තුව විසින් සම්මත කළ පනතක් නීතියක් බවට පත්වීම සඳහා සහතික කොට අනුමත කළ යුත්තේ:
(1) ජනාධිපති ය. (2) අගමැති ය. (3) කථානායක ය.
(4) සභානායක ය. (5) නීතිපති ය.

45. ශ්‍රී ලංකාවේ වර්තමාන පළාත් පාලන ක්‍රමය සමන්විත වන ආයතන වන්නේ:
(1) පළාත් සභා, මහ නගර සභා, නගර සභා සහ ප්‍රාදේශිය සභාවලිනි.
(2) මහ නගර සභා, නගර සභා සහ ප්‍රාදේශිය සභාවලිනි.
(3) මහ නගර සභා, නගර සභා, ප්‍රාදේශිය සභා සහ ගම් සභාවලිනි.
(4) පළාත් සභා, මහ නගර සභා, නගර සභා, ප්‍රාදේශිය සභා සහ දිස්ත්‍රික් සංවර්ධන සභාවලිනි.
(5) පළාත් සභා, මහ නගර සභා, නගර සභා, ප්‍රාදේශිය සභා, දිස්ත්‍රික් සංවර්ධන සභා සහ ගම් සභාවලිනි.

46. ශ්‍රී ලංකාවේ දේශපාලන පක්ෂ ක්‍රමය:
(1) ද්විපක්ෂ ක්‍රමයකි.
(2) ප්‍රධාන පක්ෂ දෙකක ප්‍රමුඛත්වය සහිත බහුපක්ෂ ක්‍රමයකි.
(3) සමාන ලෙස බලවත් පක්ෂ කිහිපයකින් සමන්විත බහුපක්ෂ ක්‍රමයකි.
(4) ප්‍රධාන වශයෙන් කේඩර පක්ෂවලින් සමන්විත බහුපක්ෂ ක්‍රමයකි.
(5) එක් පක්ෂයක නායකත්වය සහිත බහුපක්ෂ ක්‍රමයකි.

❂ 47 සිට 50 දක්වා ඇති ප්‍රශ්නවල මාතෘකාව සඳහා ප්‍රකාශ පහක් ඉදිරිපත් කර ඇත. ඒවා අතුරෙන් **එක්** ප්‍රකාශයක් සාවද්‍ය වේ. **සාවද්‍ය** ප්‍රකාශය තෝරන්න.

47. අන්තර්ජාතික යුක්ති අධිකරණය:
(1) නෙදර්ලන්තයේ හේග් නුවර පිහිටුවා ඇත.
(2) එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ප්‍රධාන අධිකරණ ආයතනය වේ.
(3) රාජ්‍යයන් අතර හට ගැනෙන ආරවුල් විසඳීම මෙන් ම එක්සත් ජාතීන්ගේ සංවිධානයට හා එහි විශේෂිත ආයතනවලට නීති උපදෙස් දීමේ බලය ද ඇත.
(4) පුද්ගලයින් අතර මෙන් ම අන්තර්ජාතික සංවිධාන අතර ඇතිවන ගැටුම් ද විභාග කිරීමේ බලය ඇත.
(5) මහා මණ්ඩලය හා ආරක්ෂක මණ්ඩලය විසින් නව අවුරුදු නිල කාලයක් සඳහා පත් කරන විනිශ්චයකරුවන් නවදෙනකුගෙන් සමන්විත වේ.

48. පොදු රාජ්‍ය මණ්ඩලය:
(1) එක්සත් ජාතීන්ගේ සංවිධානයේ අනුබද්ධිත සංවිධානයක් වේ.
(2) ස්වේච්ඡා සංවිධානයක් වන අතර, සාමාජිකත්වය විවෘත වන්නේ ස්වාධිපති රාජ්‍යයන්ට පමණි.
(3) බ්‍රිතාන්‍ය රජින නායකත්වය දරනු ලැබේ.
(4) ප්‍රධාන ලෙස අවධානය යොමු කරන්නේ සාමාජික රාජ්‍යයන් අතර අධ්‍යාපනය, සෞඛ්‍යය, යහපාලනය, සාධාරණ නීති ක්‍රමයක් ඇති කිරීම, මානව හිමිකම් යනාදී ක්ෂේත්‍රවල සහයෝගය වර්ධනය කිරීමට ය.
(5) වර පත්‍රයක් හෝ ව්‍යවස්ථාවක් නොමැති ලෝකයේ ඇති එක ම අන්තර්ජාතික රාජ්‍ය සංවිධානය වේ.

49. කලාපීය සහයෝගීතාව සඳහා වූ දකුණු ආසියානු සංවිධානය:
(1) අන්තර්ජාතික ක්ෂේත්‍රය තුළ පොදුවේ හඳුන්වන්නේ 'සාක්' යන නාමයෙනි.
(2) ආරම්භක වශයෙන් දකුණු ආසියාතික රාජ්‍යයන් හතක් විසින් 1985 දෙසැම්බර් 08 දින පිහිටුවන ලදී.
(3) ආර්ථික, සමාජීය, සංස්කෘතික, තාක්ෂණික, විද්‍යාත්මක යනාදී ක්ෂේත්‍රයන්හි කලාපීය සහයෝගීතාව වර්ධනය කිරීම ඉලක්ක කරගෙන ඇත.
(4) ඉහළ ම තීරණ ගැනීමේ ආයතනය වන රාජ්‍ය නායක සමුළුව වාර්ෂික ව පවත්වනු ලැබේ.
(5) තීරණ ගැනීම කරනු ලබන්නේ බහුතර ඡන්දයෙනි.

50. නොබැඳි ව්‍යාපාරය:
(1) 1961 දී පවත්වන ලද නොබැඳි රටවල නායකයින්ගේ බෙල්ග්‍රේඩ් සමුළුවේ දී පිහිටුවන ලදී.
(2) නිල වශයෙන් කිසිදු බල කඳවුරකට නොබැඳුණු රාජ්‍ය කණ්ඩායමක් ලෙස සලකනු ලැබේ.
(3) එකිනෙකාගේ දේශසීමා ඒකාග්‍රතාවට ගරු කිරීම, ආක්‍රමණික නොවීම, දේශීය කටයුතුවලට මැදිහත් නොවීම, සමානාත්මතාවය සහ සාමකාමී සහජීවනය යන මූලධර්ම මත ක්‍රියාත්මක වේ.
(4) ආයතනික යාන්ත්‍රණයක් මත ක්‍රියාත්මක වන අතර, එහි ඉහළ ම ආයතනය නොබැඳි රටවල රාජ්‍ය නායක සමුළුව වේ.
(5) සීතල යුද්ධය අවසන් වීමෙන් පසු ව අනුක්‍රමයෙන් අභාවයට පත් විය.

*****

EXAMMOOD.LK

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - 2014 අගෝස්තු (නව නිර්දේශය)

**General Certificate of Education (Adv. Level) Examination – August 2014 (New Syllabus)**

දේශපාලන විද්‍යාව **II** - පැය තුනයි

**Political Science II – Three hours**

**උපදෙස්:**

- ✠ මෙම ප්‍රශ්න පත්‍රය **A, B** හා **C** වශයෙන් කොටස් තුනකින් යුක්ත ය.
- ✠ **A** කොටස තුළ කෙටි ප්‍රශ්න 20 ක් අන්තර්ගත වේ. සම්පූර්ණ පිළිතුරක් සඳහා ලකුණු 01 ක් ද, අර්ධ පිළිතුරක් සඳහා ලකුණු ½ ක් ද හිමි වේ. මෙම කොටසේ **සියලු ම** ප්‍රශ්නවලට කෙටි පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම සපයා B හා C කොටස්වල පිළිතුරු පත්‍රයට අමුණා භාර දෙන්න.
- ✠ B හා C කොටස්වලින් ප්‍රශ්න **දෙක** බැගින් තෝරාගෙන ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සපයන්න.

EXAMMOOD.LK

## A කොටස

01. සාමාන්‍යයෙන් පිළිගත් මතය වන්නේ මිනිසුන් දේශපාලනය ඉගෙන ගැනීම මාර්ග දෙකක් මගින් කරන බව ය. එම මාර්ග **දෙක** නම් කරන්න.

    1. ..............................
    2. ..............................

02. (i) "රාජ්‍යය මිනිසාගේ ස්වභාවික අවසාන ස්ථානය වේ. මක්නිසා ද යත් මිනිසා දේශපාලන සත්ත්වයෙකු වන බැවිනි. රාජ්‍යයෙන් බාහිර ව යමෙකු ස්වාභාවික ලෙස වාසය කරන්නේ ද එක්කෝ ඔහු වනචාරී සත්ත්වයෙකු විය යුතු ය. නැතිනම් දෙවියෙකු විය යුතු ය. එවැන්නෙකු එක්කෝ මනුෂ්‍යත්වයට පහළින් සිටින්නෙකු විය යුතු ය. නැතිනම් මනුෂ්‍යත්වයට ඉහළින් සිටින්නෙකු විය යුතු ය."

    (ii) "මිනිසා නිදහස් ව ඉපදුන ද සෑම තැනක ම ඔහු යදම්වලින් බැඳ දමා ඇත."

    ඉහත දක්වූ පාඨ **දෙක** උපුටාගත් ග්‍රන්ථ **දෙකේ** නම් සහ ඒවායේ කතුවරුන්ගේ නම් සඳහන් කරන්න.

    1. ..............................
    2. ..............................

03. (i) "සමූහාණ්ඩුව"

    (ii) "දේශපාලන ව්‍යාකරණය"

    මෙම කෘති **දෙකේ** කතුවරුන්ගේ නම් පිළිවෙළින් සඳහන් කරන්න.

    1. ..............................
    2. ..............................

04. මාක්ස්වාදීන්ට අනුව ධනපති සමාජය සමන්විත වන්නේ අන්‍යෝන්‍ය වශයෙන් එකිනෙකට විරුද්ධ වූ සමාජ පංති දෙකකිනි. මෙම සමාජ පංති **දෙක** නම් කරන්න.

    1. ..............................
    2. ..............................

05. රටක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් පදනම් කරගෙන පාලනය මෙහෙයවන විට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ක්‍රියාකාරිත්වය හා සම්බන්ධ ව පිළිගැනෙන ඉතා ම වැදගත් මූලික නීතිමය පිළිගැනීම් දෙකක් හඳුනාගත හැක. එම නීතිමය පිළිගැනීම් **දෙක** නම් කරන්න.

    1. ..............................
    2. ..............................

06. සන්ධීය ආණ්ඩුක්‍රමයකින් ඒකීය ආණ්ඩුක්‍රමයක් වෙනස්වන්නේ ප්‍රධාන වශයෙන් කරුණු දෙකක් හේතුකොටගෙන ය. එම කරුණු **දෙක** සඳහන් කරන්න.

    1. ..............................
    2. ..............................

07. ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයන්හි අධිකරණවලට විනිශ්චයකරුවන් පත්කෙරෙන ක්‍රම අතුරෙන් **දෙකක්** සඳහන් කරන්න.

    1. ..............................
    2. ..............................

08. රාජ්‍යයක ස්වාධිපතිත්වය පැති දෙකකින් යුක්ත ය. එම පැති **දෙක** නම් කරන්න.

    1. ..............................
    2. ..............................

09. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මහලේකම්වරයා සහ අන්තර්ජාතික යුක්ති අධිකරණයේ විනිශ්චයකරුවන් පත් කරන්නේ එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ආයතන දෙකක් ඒකාබද්ධ ව ය. එම ආයතන **දෙක** නම් කරන්න.

    1. ..............................
    2. ..............................

10. ඉන්දියාවේ ජනාධිපතිවරයා තෝරාපත් කරන ඡන්ද විද්‍යාලය සමන්විත වන්නේ මන්ත්‍රීවරු දෙවර්ගයකිනි. එම දෙවර්ගය සඳහන් කරන්න.

1. ..........................................................................................
2. ..........................................................................................

11. 1833, 1911, 1920 සහ 1924 යන වර්ෂවල දී ක්‍රියාවට නංවන ලද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ යටතේ පිහිට වූ ව්‍යවස්ථාදායක සභා සමන්විත වූයේ මන්ත්‍රීවරුන් වර්ග දෙකකිනි. එම දෙවර්ගය සඳහන් කරන්න.

1. ..........................................................................................
2. ..........................................................................................

12. ඩොනමෝර් ආණ්ඩුක්‍රමය යටතේ පිහිට වූ සාමාජිකයන් 61 දෙනෙකුගෙන් සමන්විත වූ අතර, එයින් 58 දෙනෙකු තෝරා ගන්නේ ක්‍රම දෙකක් අනුව ය. එම ක්‍රම **දෙක** සහ ඒ ඒ ක්‍රමය යටතේ පත්කරගත් මන්ත්‍රීවරුන්ගේ සංඛ්‍යාව පිළිවෙළින් සඳහන් කරන්න.

1. ..........................................................................................
2. ..........................................................................................

13. 1948 සෝල්බරි ව්‍යවස්ථාව යටතේ පිහිට වූ මහජන මන්ත්‍රී මණ්ඩලය සමන්විත වූයේ ක්‍රම දෙකක් අනුව තෝරාපත්කර ගන්නේ මන්ත්‍රීවරුන්ගෙනි. එම තෝරා පත්කර ගැනීමේ ක්‍රම **දෙක** සඳහන් කරන්න.

1. ..........................................................................................
2. ..........................................................................................

14. 1948 සෝල්බරි ව්‍යවස්ථාව යටතේ සහ 1972 පළමු ජනරජ ව්‍යවස්ථාව යටතේ නාමික විධායකය හැඳින්වීම සඳහා භාවිත කළ නිල නාම **දෙක** පිළිවෙළින් නම් කරන්න.

1. ..........................................................................................
2. ..........................................................................................

15. (i) 1972 ව්‍යවස්ථාව යටතේ පිහිට වූ ව්‍යවස්ථා අධිකරණයේ සංයුතිය දක්වන්න.

..........................................................................................

(ii) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කරුණු තීරණය කිරීම සඳහා ව්‍යවස්ථා අධිකරණය කැඳවූ විට ඒ සඳහා සහභාගී වන විනිශ්චයකරුවන්ගේ සංඛ්‍යාව සඳහන් කරන්න.

..........................................................................................

16. 1978 ව්‍යවස්ථා යටතේ රාජ්‍ය භාෂා ලෙස පිළිගෙන ඇති භාෂා **දෙක** නම් කරන්න.

1. ..........................................................................................
2. ..........................................................................................

17. 1978 ව්‍යවස්ථාව යටතේ ස්ථාපිතකර තිබෙන ඉහළ අධිකරණ ක්‍රම **දෙක** සහ එම අධිකරණ දෙකේ සංයුතිය සඳහන් කරන්න.

1. ..........................................................................................
2. ..........................................................................................

18. (i) ජනාධිපති මැතිවරණ පෙත්සම
(ii) පාර්ලිමේන්තු මැතිවරණ පෙත්සම

ඉහත දක්වා ඇති පෙත්සම් විභාග කිරීමේ අධිකරණ බලය සහිතව 1978 ව්‍යවස්ථාව යටතේ පිහිටුවා ඇති අධිකරණ **දෙක** පිළිවෙළින් නම් කරන්න.

1. ..........................................................................................
2. ..........................................................................................

19. "ශ්‍රී ලංකාවේ දේශපාලන පක්ෂ ක්‍රමය ප්‍රධාන පක්ෂ දෙකක නායකත්වය යටතේ ක්‍රියාත්මක වන බහු පක්ෂ ක්‍රමයක් ලෙස හැඳින් වේ." එම ප්‍රධාන පක්ෂ **දෙක** නම් කරන්න.

1. ..........................................................................................
2. ..........................................................................................

20. පාර්ලිමේන්තුව නමින් හැඳින්වෙන 1978 ව්‍යවස්ථාව යටතේ ස්ථාපිත කර ඇති ව්‍යවස්ථාදායකය සමන්විත වන්නේ ක්‍රම දෙකක් යටතේ තෝරා පත්කරන මන්ත්‍රීවරුන්ගෙනි. එම ක්‍රම **දෙක** සහ ඒ ඒ ක්‍රමය යටතේ තෝරා පත්කරන මන්ත්‍රීවරුන්ගේ සංඛ්‍යාව සඳහන් කරන්න.

1. ..........................................................................................
2. ..........................................................................................

*****

EXAMMOOD.LK
EXAMMOOD.LK

අ. පො. ස. (උසස් පෙළ) විභාගය - 2014 අගෝස්තු (නව නිර්දේශය)

**දේශපාලන විද්‍යාව - II** **ප්‍රශ්න පත්‍රය**

**උපදෙස්:** **B** හා **C** කොටස්වලින් ප්‍රශ්න **දෙක** බැගින් තෝරාගෙන ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සපයන්න.

## B කොටස

01. පහත දැක්වෙන ඕනෑම මාතෘකා **දෙකක්** සාකච්ඡා කරන්න.
    (i) දේශපාලනය හා දේශපාලන විද්‍යාව අතර පවතින වෙනස්කම්
    (ii) මිනිසුන් දේශපාලනය ඉගෙන ගන්නා මාර්ග
    (iii) රාජ්‍යයේ ආරම්භය, වර්ධනය හා අනාගතය පිළිබඳ ලිබරල්වාදී **හෝ** මාක්ස්වාදී මතය
    (iv) දේශපාලන විද්‍යාව අධ්‍යයනය සඳහා යොදා ගැනෙන චර්යාවාදී **හෝ** සමාජ විද්‍යා අධ්‍යයන ප්‍රවේශයේ ප්‍රධාන ලක්ෂණ
    (v) දේශපාලන සහභාගිත්වය නිර්ණය කරන සාධක **(ලකුණු 10 × 02 = 20 යි.)**

02. පහත දැක්වෙන ඕනෑම මාතෘකා **දෙකක්** විභාග කරන්න.
    (i) රාජ්‍යය හා ආණ්ඩුව
    (ii) රාජ්‍යය හා සමාජය
    (iii) සුබසාධක රාජ්‍ය ක්‍රමය හා අවම රාජ්‍ය ක්‍රමය අතර පවතින වෙනස්කම්
    (iv) ප්‍රජාතන්ත්‍රවාදී සහ සමූහ ආඥාදායක ආණ්ඩුක්‍රම අතර පවතින වෙනස්කම් **(ලකුණු 10 × 02 = 20 යි.)**

03. පහත දැක්වෙන ඕනෑම මාතෘකා **දෙකක්** සාකච්ඡා කරන්න.
    (i) බ්‍රිතාන්‍ය රජිනගේ බලතල, කාර්යයන් හා තත්ත්වය
    (ii) ඉන්දියානු සන්ධීය ආණ්ඩුක්‍රමය තුළ විධායකය, ව්‍යවස්ථාදායකය අතර පවත්නා සම්බන්ධතා
    (iii) පස්වන සමූහාණ්ඩු ක්‍රමය යටතේ ප්‍රංශයේ ජනාධිපතිවරයාගේ බලතල හා කාර්යයන්
    (iv) ස්විට්සර්ලන්තයේ මධ්‍යම ආණ්ඩුවේ සන්ධීය සභාවේ බලතල හා කාර්යයන්
    (v) ඇමෙරිකානු ආණ්ඩුක්‍රමය තුළ සෙනෙට් සභාවේ ක්‍රියාකලාපය **(ලකුණු 10 × 02 = 20 යි.)**

04. පහත දැක්වෙන ඕනෑම මාතෘකා **දෙකක්** පිළිබඳ ව අදහස් දක්වන්න.
    (i) අන්තර්ජාතික දේශපාලනයේ ස්වභාවය
    (ii) රාජ්‍ය ප්‍රතිපත්ති ජීවන චක්‍රය
    (iii) ගැටුම් වැළැක්වීම හා ගැටුම් කළමනාකරණය අතර පවතින වෙනස්කම් **(ලකුණු 10 × 02 = 20 යි.)**

## C කොටස

05. පහත දැක්වෙන ඕනෑම මාතෘකා දෙකක් සාකච්ඡා කරන්න.
    (i) 1833 කෝල්බෲක්-කැමරන් ප්‍රතිසංස්කරණ මගින් කළ නිර්දේශ
    (ii) 1924 මැනිං-ඩෙවන්ෂයර් ප්‍රතිසංස්කරණයේ මූලික අංග ලක්ෂණ
    (iii) ලංකා ජාතික ව්‍යාපාරයේ ස්වභාවය
    (iv) ලංකාවේ වාමාංශික ව්‍යාපාරයේ ආරම්භය හා වර්ධනය **(ලකුණු 10 × 02 = 20 යි.)**

06. පහත දැක්වෙන ඕනෑම මාතෘකා **දෙකක්** විශ්ලේෂණය කරන්න.
    (i) ඩොනමෝර් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ආණ්ඩුකාරයාගේ බලතල, කාර්යයන් හා තත්ත්වය
    (ii) 1948 ව්‍යවස්ථාව යටතේ නාමික විධායකයේ බලතල, කාර්යයන් හා තත්ත්වය
    (iii) 1972 ව්‍යවස්ථාව යටතේ පිහිට වූ ව්‍යවස්ථාදායකයේ බලතල, කාර්යයන් හා තත්ත්වය
    (iv) 1978 ව්‍යවස්ථාව යටතේ විධායකය සහ ව්‍යවස්ථාදායකය අතර පවත්නා සම්බන්ධතා
    (v) 1978 ව්‍යවස්ථාව යටතේ හඳුන්වා දුන් සමානුපාතික නියෝජන ක්‍රමයේ යහපත් සහ අයහපත් ලක්ෂණ
    **(ලකුණු 10 × 02 = 20 යි.)**

07. පහත දැක්වෙන ඕනෑම මාතෘකා **දෙකක්** ගැන අදහස් දක්වන්න.
    (i) ශ්‍රී ලංකාවේ දේශපාලන පක්ෂ ක්‍රමයේ ප්‍රධාන ලක්ෂණ
    (ii) ශ්‍රී ලංකාවේ පළාත් ආණ්ඩුකාරවරයාගේ බලතල හා කාර්යයන්
    (iii) 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට කරන ලද 18 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය
    (iv) 1978 ව්‍යවස්ථාව යටතේ ස්ථාපිත කළ ශ්‍රේෂ්ඨාධිකරණයේ බලතල හා කාර්යයන්
    (v) ශ්‍රී ලංකාවේ මානව හිමිකම් කොමිසම **(ලකුණු 10 × 02 = 20 යි.)**

08. පහත දැක්වෙන ඕනෑම මාතෘකා **දෙකක්** ගැන කෙටියෙන් අදහස් දක්වන්න.
    (i) දකුණු ආසියානු කලාපීය සහයෝගිතා සංවිධානයේ මූලධර්ම හා අරමුණු
    (ii) එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මහා මණ්ඩලයේ බලතල හා කාර්යයන්
    (iii) අන්තර්ජාතික රතු කුරුස කමිටුවේ (ICRC) ක්‍රියා කලාපය
    (iv) ජාත්‍යන්තර ක්ෂමා සංවිධානයේ ක්‍රියා කලාපය **(ලකුණු 10 × 02 = 20 යි.)**

*****

EXAMMOOD.LK
EXAMMOOD.LK